## සුරාබදු තෑගි අරමුදල - 2015
------------------------------

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු තෑගි අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1912 අංක 8 දරන සුරාබදු ආඥා පනතේ 58 ඒ වගන්තිය යටතේ පළකළ 1994 මාර්තු 4 දිනැති අංක 818 දරන සුරාබදු නිවේදනයේ 1(iii) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම
---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම
-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ජේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**2.1** **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු තෑගි අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1** **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01ට පටහැනිව මුදල් පදනම මත සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07ට අනුව පිරිවැය රු.47,134,000ක් වූ ගොඩනැගිලි සඳහා ක්ෂය ගණනය කර අදාල ගැලපීම් සිදුකර නොතිබුණි.

**2.2.2.** **ගිණුම්කරණ අඩුපාඩු**

කාර්මික අපරාධ නිරවුල් වනතෙක් ඒ වෙනුවෙන් රඳවාගත් ආරක්ෂක තැන්පතු රු.185,000ක් වගකීමක් ලෙස දක්වනවා වෙනුවට ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

**2.2.3.** **නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| **නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) 1999 අංක 8 දරන දුම්කොළ බදු පනතේ 17 වන වගන්තිය | සුරාබදු කොමසාරිස් ජනරාල්වරයාගේ පාලනය යටතේ පවතින දුම්කොළ තෑගි අරමුදලක් ස්ථාපිත කර දුම්කොළ බදු පනත යටතේ අය කරනු ලබන දඩ මුදලින් 1/4ක් දුම්කොළ තෑගි අරමුදලට මාරුකල යුතු වුවත්, දුම්කොළ අරමුදලක් ස්ථාපිත නොකර දුම්කොළ දඩ මුදල් ලැබීම්, සුරාබදු තෑගි අරමුදල යටතේ දුම්කොළ තෑගි අරමුදලට ගෙවිය යුතු මුදල් වශයෙන් ගිණුම්ගත කර තිබුණි. |
| (ආ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | අරමුදල සතු ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ඇ) 1994 මාර්තු 04 දිනැති අංක 818 දරන සුරාබදු නිවේදනය විශේෂ කොන්දේසි (v), (vi) | වැටලීම් සඳහා කෙළින්ම සම්බන්ධ නිලධාරියෙකුට අර්ධ වාර්ෂිකව ගෙවිය හැකි තෑගි මුදල එම නිලධාරියාගේ මාස 06ක වැටුප නොඉක්මවිය යුතු නමුත් 2012, 2013 හා 2014 වර්ෂවලට අදාල තෑගි මුදල් රු.30,763,997ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.79,009,718ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.63,375,039ක් වූයෙන්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.15,634,679ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. සමථ ගාස්තු ලැබීම් ප්‍රමාණය රු.15,406,633ක ප්‍රමාණයකින් වැඩි වී තිබීම මෙම අතිරික්තයේ වර්ධනයට මූලිකව බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

අරමුදල ඇතිකිරීමේ පරමාර්ථයන් ලෙස

* සුරාබදු නිලධාරීන්, තොරතුරු සපයන්නන් සහ වෙනත් අයට තෑගි මුදල් ගෙවීම
* පුහුණු කිරීම් සහ අධ්‍යාපනික කර්තව්‍යයන්ට මුදල් සැපයීම.
* වර්ෂයකට රු.50,000 ක සීමාවකට යටත්ව සුරාබදු දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ ක්‍රීඩා, විනෝද සහ සුභ සාධක වැඩවලට මුදල් සැපයීම .
* සුරාබදු දෙපාර්තමේන්තුවට අවශ්‍ය ද්‍රව්‍ය, උපකරණ සහ වෙනත් දෑ මිලදී ගැනීම.
* ප්‍රශංසනීය වැඩ, නිර්භීත ක්‍රියා හෝ විශේෂ පිළිගැනීමක් කළ යුතු වෙනත් ක්‍රියාවලට තෑගි මුදල් ගෙවීම හා
* විශේෂ රාජකාරීන් හෝ විශේෂ වැටලීම් සඳහා ක්ෂේත්‍රයට වැටලීම් පිරිස් යැවීමේ දී දෙපාර්තමේන්තුවට දරන්නට සිදුවිය හැකි වියදම් පියවීම යනාදිය දැක්වුණි.

මෙම අරමුණු ඉටුකිරීම සම්බන්ධව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී සුරාබදු කාර්මික අපරාධ වැටලීම් 4,932 ක් මඟින් රු.178,507,964ක ආදායමක් උපයා තිබූ අතර, ඉකුත් වර්ෂයේදී සුරාබදු කාර්මික අපරාධ වැටලීම් 5,319ක් මඟින් රු.163,101,331ක ආදායමක් උපයා තිබුණි. මේ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ කාර්මික අපරාධ වැටලීම් ආදායම රු.15,406,633ක් හෙවත් සියයට 9ක වැඩිවීමක් දක්නට ලැබුණද වැටලීම් ගණන 387කින් හෙවත් සියයට 7ක අඩුවීමක් නිරීක්ෂණය විය.

(ආ) වාර්ෂික අයවැය ලේඛනය අනුව තෑගි මුදල් ගෙවීම් සඳහා රු.108,750,000ක් වෙන්කර තිබුණද, සමාලෝචිත වර්ෂයේදී රු.65,523,136ක් පමණක් ගෙවා තිබීම හේතුවෙන් රු.43,226,864ක් හෙවත් සියයට 40ක් ඉතිරි වී තිබුණි. තෑගි අරමුදලේ ප්‍රධාන අරමුණ නිලධාරීන් දිරිමත් කිරීම වුවත්, එම අරමුණ අරමුදල විසින් ඉටු කලේද යන්න විගණනයේදී පැහැදිලි නොවුණි.

(ඇ) විශේෂ රාජකාරී හෝ විශේෂ වැටලීම් සහ පුහුණු හා අධ්‍යාපනික කර්තව්‍යයන්ට පිළිවෙලින් රු.800,000ක් හා රු.4,000,000ක් වෙන්කර තිබුණද, ඒ සඳහා පිළිවෙලින් රු.18,690ක් හා රු.926,947ක් වැය කර තිබුණි. මේ අනුව විශේෂ රාජකාරී හෝ විශේෂ වැටලීම් සඳහා වෙන්කල මුදලින් රු.781,310ක් හෙවත් සියයට 98ක්ද, පුහුණු හා අධ්‍යාපනික කර්තව්‍යයන්ට වෙන්කල මුදලින් රු.3,073,053ක් හෙවත් සියයට 77ක්ද ඉතිරි වී තිබුණි.

(ඈ) අරමුදලේ පුහුණු හා අධ්‍යාපනික කර්තව්‍යයන් යටතට අයත් නොවූ මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්වලට සහභාගී වූවන්ට ආහාර සැපයීම හා අදාල වෙනත් වියදම් සඳහා එකතුව රු.314,898ක් අරමුදලින් ගෙවීම් කර තිබුණි.

(ඉ) 1994 මාර්තු 04 දිනැති අංක 818 දරන සුරාබදු නිවේදනයේ 4.5 වගන්තිය ප්‍රකාර, නිර්භීත ක්‍රියා හෝ විශේෂ පිළිගැනීම් කටයුතු සඳහා වාර්ෂිකව රු.200,000ක් වෙන් කර තිබුණද, සමාලෝචිත වර්ෂයේදී මෙන්ම සුරාබදු නිවේදනය නිකුත් කළ දින සිටම එවැනි ක්‍රියා සඳහා අරමුදලින් ගෙවීම් කර නොතිබුණි.

**4.2 ආර්ථික නොවූ ගනුදෙනු**

---------------------------

වෘත්තීය සමිති නායකයින් සඳහා දින 2ක පුහුණු වැඩසටහනක් සංවිධානය කර, පුහුණු වන්නන් වෙනුවෙන් ගෙවීම් කිරීමේදී වැඩමුළුවට සහභාගී නොවූවන් වෙනුවෙන් ගෙවීම් කර තිබීම හේතුවෙන් රු.67,037 ක ආර්ථික නොවූ වියදමක් පවතින බව නිරීක්ෂණය විය.

**4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

----------------------------------------

අරමුදලින් මිලදී ගෙන තිබූ රු.97,113 ක් වටිනා පුස්තකාල පොත් තොගයක් වසර 03කට ආසන්න කාලයක සිට ඌන උපයෝජිතව පැවතුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

----------------------------------------

**5.1 ක්‍රියාකාරී සැලැස්ම**

---------------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**5.2 නොවිසඳී ඇති විගණන ජේද**

--------------------------------

**1994** මාර්තු 04 දිනැති අංක 818 දරන සුරාබදු නිවේදනය අනුව පිහිටුවනු ලැබූ සුරාබදු තෑගි අරමුදලින් සුරාබදු නිලධාරීන්, තොරතුරු සපයන්නන් සහ වෙනත් අයට තෑගි ගෙවීම් සහ නිර්භීත ක්‍රියා හෝ විශේෂ පිළිගැනීම් සඳහා සුදුසු නිලධාරීන් තෝරාගැනීම සඳහා වූ අනුමත ලිඛිත ක්‍රමවේද සකස් කළ යුතුව තිබුණද, 2016 අප්‍රේල් 30 දින වනවිටත් එවැනි ක්‍රමවේද පිළියෙල කර නොතිබුණි.

**6.** **පද්ධති හා පාලනයන්**

------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සුරාබදු කොමසාරිස් ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| | | |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | ආදායම් හා වියදම් ගිණුම්ගත කිරීමේ දී උපචිත පදනම අනුගමනය කිරීම. |
| (ආ) | වත්කම් පාලනය | අරමුදලේ හා දෙපාර්තමේන්තුවේ වත්කම් වෙන් වෙන් වශයෙන් හඳුනාගෙන ගිණුම්ගත කිරීම හා වත්කම් සඳහා ක්ෂය ප්‍රතිපාදනය නිවැරදිව සිදුකිරීම. |